# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.03.29 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 529 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු.</u>

***பொலிஸ் ஊடக பிரிவுக்கு கிடைத்த தகவல்கள்***

**01. මත්ද්‍රව්‍ය ජාවාරම් සඳහා ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2026.01.29 දින බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගනේමුල්ල පොලිස් වසමේදී කොකේන් මත්ද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 04 ග්‍රෑම් 423ක් හා මත්පෙති 3450 ක් සමග අත්අඩංගුවට ගන්නා ලද සැකකරිය සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන ආරම්භ කර තිබිණි.

මෙම මත්ද්‍රව්‍ය ජාවාරම සඳහා සැකකාරියගේ ස්වාමි පුරුෂයා හා පුත්‍රයා ආධාර අනුබල දී ඇති බවටත්, ඔවුන් මුහුදු මාර්ගයෙන් ඉන්දියාව වෙත පලාගොස් සිටින බවටත් වැඩිදුරටත් අනාවරණය වී ඇත.

මෙම සැකකරුවන් දෙදෙනා නීතිවිරෝධී ලෙස ඉන්දියාවේ රැඳී සිටියදී 2026.03.24 දින ඉන්දීය ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගෙන 2026.03.28 දින මොවුන් මෙරටට පිටුවහල් කර ඇත.

ඒ අනුව කටුනායක ගුවන්තොටුපල පැමිණීමේ පර්යන්තයේදී එදින දහවල් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මෙම සැකකරුවන් දෙදෙනා මත්ද්‍රව්‍ය ජාවාරම් සඳහා ආධාර අනුබල දීමේ වරදට අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වෙත භාරදී ඇත.

**සැකකරුවන් අවුරුදු 23 හා 57 යන වයස්වල පසුවන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***போதைப்பொருள் கடத்தலுக்கு உடந்தையாக இருந்த சந்தேகநபர்கள் இருவர் கைது – வட மேல் மாகாணத்தின் வடக்கு குற்றப்பிரிவு***

2026.01.29 அன்று வட மேற்கு மாகாணம் வடக்கு குற்றப்பிரிவு அதிகாரிகள் குழு, கணேமுள்ள பொலிஸ் பிரிவில் ஒரு சந்தேகநபரை கொக்கைன் (4.423 கிலோ) மற்றும் போதை மாதிரிகள் (3,450) உடன் கைது செய்தது.

மேலும் விசாரணையில், இந்த கடத்தலுக்கு சந்தேகநபரின் கணவன் மற்றும் மகன் உதவியதாகவும், அவர்கள் கடல் வழியாக இந்தியா சென்றுள்ளதாகவும் கண்டறியப்பட்டது.

இந்த சந்தேகநபர்கள் 2026.03.24 அன்று இந்திய பாதுகாப்பு நிறுவனங்கள் கைது செய்து, 2026.03.28 அன்று நாட்டிற்கு தாயகத்துக்கு ஒப்படைக்கப்பட்டனர்.

இதன்படி, கட்டுநாயக்க விமான நிலையத்தில் வந்தவர்களை, குற்றவியல் விசாரணைத் திணைக்களத்தின் அதிகாரிகள் கடத்தலுக்கு உடந்தையாக இருந்த குற்றச்சாட்டில் மீண்டும் கைது செய்து, மேலதிக விசாரணைக்காக வட மேற்கு மாகாண குற்றப்பிரிவினரிடம் ஒப்படைத்தனர்.

சந்தேகநபர்கள் வயது 23 மற்றும் 57 மற்றும் கொழும்பு 15 பகுதியில் வசிப்பவர்கள். மேலதிக விசாரணைகள் தொடர்கின்றன.

## 02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පෑලියගොඩ පොලිස් ස්ථානය

2026.03.28 දින සවස පෑලියගොඩ පොලිස් වසමේ නුගේ පාර ප්‍රදේශයේදී පෑලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සැකකටයුතු යතුරුපැදියක් පරික්ෂා කර හෙරොයින් කිලෝග්‍රෑම් 01 ග්‍රෑම් 642 ක් හා යතුරුපැදියද සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 37 ක් වන කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පෑලියගෙඩ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## ஹெரோயின் உடன் சந்தேகநபர் கைது – பேலியகொடை பொலிஸ் பிரிவு

2026.03.28 அன்று மாலை, பேலியகொடை பொலிஸ் பிரிவு, நுகேவீதி பகுதியில் சந்தேகத்துள்ள மோட்டார் சைக்கிளை பரிசோதித்து, ஹெரோயின் (1.642 கிலோ) உடன் சந்தேகநபரை கைது செய்தது.

சந்தேகநபர் 37 வயதாகவும், கொழும்பு 12 பகுதியில் வசிப்பவர். பேலியகொடை பொலிஸ் பிரிவு மேலதிக விசாரணைகளை நடத்துகிறது.

## 03. කැබ් රථයක් යතුරුපැදියක ගැටී යතුරුපැදිකරු හා පසුපැදිකරු ජීවිතක්ෂයට - කුච්චවේලි පොලිස් වසම.

2026.03.28 දින දහවල් කුච්චවේලි පොලිස් වසමේ ත්‍රිකුණාමලය පුල්මුඩේ මාර්ගයේ සලපයාරු ප්‍රදේශයේදී ත්‍රිකුණාමලය දෙස සිට කුච්චවේලි දෙසට ධාවනය වූ කැබ් රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක ගැටී අනතුරක්

සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකරු කුච්චවේලි රෝහලට ඇතුලත් කිරීමෙන් පසු දෙදෙනාම මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 65 හා 75 යන වයස්වල පසුවන තිරියාය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කුච්චවේලි පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### கெப் மற்றும் மோட்டார் சைக்கிள் மோதி விபத்து – குச்சிவேலி பொலிஸ் பிரிவு

2026.03.28 அன்று பகலில், குச்சிவேலி பொலிஸ் பிரிவு, திருக்கோணமலை புல்மோட்டை வீதியில், திருக்கோணமலை நோக்கிச் சென்ற கெப் வாகனத்தில், எதிர் திசையில் வந்த மோட்டார் சைக்கிளுடன் மோதியதில் மோட்டார் சைக்கிளை செலுத்தியவரும் பின்னால் பயணித்தவரும் உயிரிழந்துள்ளனர்.

இறந்தவர்கள் வயது 65 மற்றும் 75, திரியையா பகுதியில் வசிப்பவர்கள். மேலதிக விசாரணைகள் குச்ச்வேலி பொலிசாரால் நடைபெற்று வருகிறது.

**பொலிஸ் ஊடக பிரிவு**